# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1607 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 21/10/2024<br>පැය 0700 |

## මාධ්‍ය නිවේදනය

**ව්‍යාජ දුරකතන ඇමතුම් ලබා දී වංචා සහගත ලෙස මුදල් ලබා ගැනීම් සිදු කරන පුද්ගලයින්ට නොරැවටෙන ලෙසට මහජනතාව දැනුවත් කිරීම.**

දිවයිනේ විවිධ ප්‍රදේශ වල ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ 09 කට පමණ ව්‍යාජ දුරකතන ඇමතුම් ලබා දී එම ඩිපෝවල කළමණාකරු, ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හෝ ඔවුන්ගේ පවුලේ ඥාතීන් යම්කිසි ස්ථානයක හදිසි ආපදාවකට ලක්වී සිටින බවත්, ඔවුන් පැමිණි වාහනය අලුත්වැඩියා කර ගැනීම සඳහා රුපියල් 10,000/- ක් වැනි හදිසි මුදලක් ඊෂිකෑෂ් ක්‍රමයට එවන ලෙසට දුරකතන අංකයක් ලබා දී දැනුම් දීමේ සිද්ධීන් පිලිබඳව පසුගිය දින කිහිපය තුල පොලිස් ස්ථාන වෙත පැමිණිලි ලැබී ඇත. එහිදී ඇතැම් ස්ථාන මගින් මුදල් ලබා දීම් සිදු කර ඇති බවටත් තොරතුරු වාර්තා වී ඇති අතර ඒ සම්බන්ධයෙන් මේ වන විට විමර්ශන සිදු කරමින් පවතී.

දැනට වසර කිහිපයක සිට පොලිස් ස්ථාන වෙත මෙම ආකාරයේ සිද්ධීන් සම්බන්ධව අවස්ථා ගණනාවකදී පැමිණිලි ලැබී ඇත. ඇතැම් විට මෙහිදී දුරකතන ඇමතුම් ලබා දෙන පුද්ගලයින් ගරාජයක හිමිකරුවෙකු, නැතහොත් එම ස්ථානයට පැමිණි පොලිස් නිලධාරියෙකු හෝ වෙනත් විශේෂිත පුද්ගලයෙකු ලෙස හඟවමින් සැලසුම් සහගත ලෙස උපක්‍රමශීලිව පණිවිඩය ලබා ගනු ලබන පුද්ගලයාට යම්කිසි විශ්වාසයක් හැඟවෙන පරිදි කථා කරමින් මෙවැනි ආකාරයට වංචා සහගත ලෙස මුදල් ලබා ගැනීම් සිදු කර ඇති බවට නිරීක්ෂණය වී ඇත.

මෙවැනි ඇමතුම් ලබා දෙන දුරකතන අංක පිලිබඳ පරීක්ෂා කිරීම් වලදී බොහෝ අවස්ථා වල එම අංක මියගිය පුද්ගලයින් හෝ විදේශිකයින් ආශ්‍රිතව ලබා ගත් සිම් කාඩ්පත් බවට හා සැකකරුවන් බොහෝවිට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ හෝ යම් මත්ද්‍රව්‍ය ජාවාරම් වලට සම්බන්ධ පුද්ගලයින් බවත්, මෙය සංවිධානාත්මකව කරනු ලබන ක්‍රියාවක් බවත් නිරීක්ෂණය වී ඇත.

එබැවින් තමාට එවැනි දුරකතන ඇමතුමක් ලැබුන හොත් කෙසේ හෝ එම ආපදාවට ලක්වූ බවට සඳහන් පුද්ගලයින් දුරකතනයෙන් සම්බන්ධ කර ගෙන එහි සත්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කරන ලෙසත්, මෙවැනි වංචානික ක්‍රියාවන්ට හසු නොවන ලෙසටත්, පොලිසිය මහජනතාවගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**